# ආර්ථික විද්‍යාව
# ගුරුභවතුන් සදහා වන සම්මන්ත්‍රණය

## මිල ප්‍රතිවිපාකය, ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකය

# මිල ප්‍රතිවිපාකය

- භාණ්ඩයක මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධය පැහැදිලි කිරීම සඳහා යොදාගන්නා ප්‍රධාන ප්‍රවේශයක් වන්නේ මිල ප්‍රතිවිපාකයයි.
- මිල ප්‍රතිවිපාකයේ උප ප්‍රති විපාක දෙකකි.
  - 1. මිල වෙනස් වීමක ආදේශන ප්‍රතිවිපාකය
  - 2. මිල වෙනස්වීමක ආදායම් ප්‍රතිවිපාකය

# ආදේශන ප්‍රතිවිපාකය

- ආදේශන ප්‍රතිවිපාකයේදී පැහැදිලි කෙරෙන්නේ මිල හැර අනෙකුත් කරුණු නොවෙනස්ව පවතිද්දී සලකා බලන භාණ්ඩයේ මිල වෙනස් වීම හේතුකොටගෙන එහි සාපේක්ෂ මිල වෙනස්වීම නිසා සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය කෙසේ වෙනස් වේද යන්නයි.

- මෙය සෑම අවස්ථාවකම සෘණ වේ.

- නිදසුනක් ලෙස අනෙකුත් සාධක නොවෙනස්ව පවතිද්දී සලකා බලන භාණ්ඩයේ මිල අඩු වූ විට එහි සාපේක්ෂ මිල අඩුවේ. එවිට සාපේක්ෂව ලාබදායක භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය වැඩි වේ. මෙහිදී සාපේක්ෂ මිල අඩුවන විට ඉල්ලුම් ප්‍රමාණය වැඩිවන නිසා එම විචල්‍ය දෙක අතර පවතින්නේ සෘණ සම්බන්ධයක.

# ආදායම් ප්‍රතිවිපාකය

- ආදායම් ප්‍රතිවිපාකය පැහැදිලි කිරීමේ දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහෝ දෙනෙකු අවබෝධ කර ගන්නේ එය ආදායම වෙනස්වීමක ප්‍රතිපලයක් ලෙසයි. නමුත් ආදායමේ මූර්ත අගය වෙනස් වීමක් හේතු කොට ගෙන ආදායම් ප්‍රතිවිපාකය සිදු වන බව තේරුම් ගත යුතුයි.
- සලකා බලන භාණ්ඩයේ මිල වැඩිවන විට ඉල්ලුම් ප්‍රමාණය අඩුවන්නේ ආදායමේ මූර්ත අගය අඩුවන නිසාය.
- කිසියම් භාණ්ඩයක මිල රුපියල් 10 ක් වන අවස්ථාවේ රුපියල් 1000 ක ආදායම් ලාභියෙකුට මිලදී ගැනීමට හැකි වන්නේ ඒකක 100 කි. එම භාණ්ඩයේ මිල රුපියල් 20 ක් වන අවස්ථාවේ දී රුපියල් 1000 ක ආදායමට මිල දී ගැනීමට හැකි වන්නේ ඒකක 50 කි. එමෙන්ම, නව මිල යටතේ ඒකක 100 මිලදී ගැනීමට රුපියල් 2000 අවශ්‍ය වේ.
- මේ මගින් පැහැදිලි වන්නේ සලකා බලන භාණ්ඩයේ මිල වැඩිවීම හේතුකොටගෙන මූර්ත ආදායම පහල යාම නිසා භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය පහල යන බවයි. ඒ අනුව මූර්ත ආදායමේ වෙනස්වීම සහ ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස්වීම අතර පවතින සම්බන්ධතාවය ආදායම් ප්‍රතිවිපාකය මගින් පෙන්නුම් කරයි.

| භාණ්ඩ වර්ගය | මිල වෙනස්වීම | ආදේශන ප්‍රතිවිපාකය ඇතිවීම | | | ආදායම් ප්‍රතිවිපාකය ඇතිවීම | | | මිල ප්‍රතිවිපාකය | ඉල්ලුම් න්‍යායට අනුකූලබව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | සාපේක්ෂ මිල | ඉල්ලුම් ප්‍රමාණය | ආදේශන ප්‍රතිවිපාකය | මූර්ත ආදායම | ඉල්ලුම් ප්‍රමාණය | ආදායම් ප්‍රතිවිපාකය | | |
| සාමාන්‍ය භාණ්ඩ | මිල පහළ යාමක් | පහළ යයි | ඉහල යයි | (සෘණ) | ඉහල යයි | ඉහල යයි | + (ධන) | (සෘණ) | අනුකූල වේ |
| | මිල ඉහල යාමක් | ඉහල යයි | පහළ යයි | (සෘණ) | පහළ යයි | පහළ යයි | + (ධන) | (සෘණ) | අනුකූල වේ |
| බාල භාණ්ඩ | මිල පහළ යාමක් | පහළ යයි | ඉහල යයි | (සෘණ) | ඉහල යයි | පහළ යයි | (සෘණ) | (සෘණ) | අනුකූල වේ |
| | මිල ඉහල යාමක් | ඉහල යයි | පහළ යයි | (සෘණ) | පහළ යයි | ඉහල යයි | (සෘණ) | (සෘණ) | අනුකූල වේ |
| ගිෆන් භාණ්ඩ | මිල පහළ යාමක් | පහළ යයි | ඉහල යයි | (සෘණ) | ඉහල යයි | පහළ යයි | (සෘණ) | + (ධන) | අනුකූල නොවේ |
| | මිල ඉහල යාමක් | ඉහල යයි | පහළ යයි | (සෘණ) | පහළ යයි | ඉහල යයි | (සෘණ) | + (ධන) | අනුකූල නොවේ |